.

# බාල රෝග සහ පලු ගුලිය

පාරම්පරික වෛද්‍ය විලියම් රණසිංහ

දකුණු ලක බාල රෝග නැතහොත් ළමා රෝග චිකිත්සාව සම්බන්ධයෙන් සලකා බලන කල පලු ගුලිය ප්‍රධානත්වයක් ගනී. දේශීය චිකිත්සාවේ අනන්‍යතාව තහවුරු කරන එක් අවස්ථාවක් වන මෙම ගුලිය කිරි බෙහෙත ලෙස ද පාරම්පරික වෛද්‍යවරු අතර ප්‍රචලිත ය. උපන් දා සිටම ළදරුවන් හට ඔවුන්ගේ ඕනෑම රෝගාබාධයකට ම ප්‍රතිකාර වශයෙන් ලබාදිය හැකි මහඟු ප්‍රත්‍යක්ෂ අත්දුටු ඖෂධයකි. විශේෂයෙන් ම ළදරුවන්ගේ වමන, අජීර්ණ, කිරිමැලියන්, උණ, පනුරෝග, අතීසාර වැනි අවස්ථා සඳහා යොදා ගනී.

දේශීය චිකිත්සාවේ මහඟු පුස්තකයක් වන වටිකාප්‍රකරණය හෙවත් බෙහෙත් ගුලි කල්ක පොතෙහි ද අන්තර්ගත වන පලු ගුලිය අසමොදගම්, වදකහ, ගම්මිරිස්, වලඟසාල්, අරළු ආදී චිකිත්සීය ගුණයෙන් ප්‍රබල ඖෂධ ද්‍රව්‍ය රාශියකින් සමන්විත වේ. ඉමහත් භක්තියෙන් ඖෂධ ද්‍රව්‍ය එක්රැස් කර පිරිසිදුව සකස් කරන මෙම බෙහෙත මව්කිරෙන් ඇඹරීම සිදුකරයි. ළදරුවන්ගේ වයස, රෝගී තත්ත්වය සලකා බලා අවස්ථානුකූලව මාත්‍රාව, අනුපාන වෛද්‍යවරයා විසින් නියම කරනු ලබයි. එහෙත් විශේෂයෙන් ම පලු ගුලිය මව්කිරට ම දිය කර ලබා දීම සිරිතය.

පලු ගුලිය හෙවත් කිරි බෙහෙත පිළිබඳ පැදියෙන් මෙසේ දක්වා ඇත.

අසමොද වද මිරිස් සිවිය කුඹුගට මද ගෙන යවක ර
අතිඋඩයන් දෙදුරු අරළු මුඩමහනත් ගෙන පුස්ක ර
සවිදව මහඔසු තිප්පිලි වලගසහල් ගෙන කොතඹු ර
ලසුනුත් කුළුරැන කකුළුසුන් සැම කිරමින් සමක ර

සුනුකර පියයුරු රසයෙන් අඹරා පළුකර ගන් නේ
බඩඋත්තිල රුජා වමන කිරිමැලියන් උනගන් නේ
සෝප ගුල්ම අංඩවායු පනුලෙඩ අජීර්ණ වන් නේ
මෙල්නොප්පුත් පිත්පාංඩු අතීසාර කුමරුන් නේ

වාතරුජා ඇනුම් සහ බැරැඞි මෙම සැම ලෙඩට ම
වේලට එක ගුලියක් තනකිරට යොදා දුනොත්නිය ම
කුමරුන්නේ ලෙඩ ගුණවේ පෙර ඉසිවර බස උත්ත ම
දූනගණ දුන පළුගුලියෙන් කුමරුන් සුවවේ සත්ත ම

මෙවන් කරුණු හේතුවෙන් පලු ගුලිය හෙවත් කිරි බෙහෙත අතීතයේ පටන් අද දක්වා ම බාල රෝග හා සම්බන්ධ පාරම්පරික වෛද්‍යවරු අතර ප්‍රචලිත ප්‍රත්‍යක්ෂ ඖෂධයක් බව කිව හැකිය.